ප්‍රසම්පාදන දැන්වීම

ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව

අම්බලන්ගොඩ ධීවර වරායේ බෙසමේ පවතින වැලි කියුබ් 430 ක ප්‍රමාණය කැණීම් කර වෙරළට හෝ මුහුදට දැමීම සඳහා මිල ගණන් නැවත කැඳවීම

ප්‍රසම්පාදන අංකය : CFHC/PD/SAND/AMB//2026/49-II

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් පහත සඳහන් ප්‍රසම්පාදන කටයුතු සඳහා යෝග්‍යතා පූර්ණ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් ප්‍රාදේශීය මිල කැඳවා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. අදාළ විස්තර පහත දක්වා ඇත.

අනු අංකය	විස්තරය සහ ප්‍රසම්පාදන අංකය	ලංසු ඇපකර මුදල	ලංසු වලංගු කාලය	ආපසු නොගෙවනු ලබන තැන්පතු මුදල
01	අම්බන්ගොඩ ධීවර වරායේ බෙසමේ පවතින වැලි කියුබ් 430 ක ප්‍රමාණය කැණීම් කර වෙරළට හෝ මුහුදට දැමීම සඳහා මිල ගණන් නැවත කැඳවීම CFHC/PD/SAND/AMB/2026/49- II	වටිනාකම රුපියල් 10,000.00 කි. දී ඇති ආකෘතියට අනුව ලංසු ඇපකරය වලංගු කාලය 2026.12.03	ලංසු භාර ගන්නා අවසාන දින සිට 2026.11.05 දින දක්වා වලංගු විය යුතුය.	රු.3,500.00

කොන්තත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලබන ලංසු කරු අසාදු ලේඛන ගත නොවිය යුතුය.

ලංසු සුරක්ෂණය, ආපසු හැරවිය නොහැකි සහ ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් සිදු කරන පළමු ලිඛිත ඉල්ලීම මත කොන්දේසි විරහිතව මුදල් කළ හැකි අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබා ගත යුතු අතර සභාපති, ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, අංක: 15, රොක්හවුස් පටුමග, කොළඹ 15. නමට නිකුත් කළ යුතුය. මුදල් තැන්පතු මගින් සිදු කරන්නේ නම් මුදල් භාරකරු" ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතුය.

මේ සඳහා උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් සැපයුම්කරුවන් හෝ නම් කළ නියෝජිතයින් සඳහා 2026.09.08 දින සිට 2026.09.16 දින දක්වා රාජකාරී දිනයන් හි පෙ.ව 9.00 සිට ප.ව 3.00 දක්වා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය වෙතින් හෝ අම්බලන්ගොඩ ධීවර වරාය වෙතින් ලිඛිත ඉල්ලීමක් කිරීමෙන් ආපසු නොගෙවනු ලබන රු.3,500.00 ක මුදලක් ගෙවීමෙන් අනතුරුව ප්‍රසම්පාදන ලේඛන ලබා ගත හැකිය.

ප්‍රධාන කාර්යාල හා අම්බලන්ගොඩ ධීවර වරාය යන ස්ථානවල දී අදාළ ප්‍රසම්පාදන ලේඛනය නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

ප්‍රසම්පාදන ලේඛන පිටපත් දෙකකින් මුල් පිටපත සහ අනු පිටපත යනුවෙන් සඳහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර තනි කවරයකට බහා ඉදිරිපත් කළ යුතුය.

නියමිත පරිදි අත්සන් කොට නිල රබර් මුද්‍රාව යොදා ප්‍රසම්පාදන ලේඛන ලිපි කවරයක ඇතුළත් කොට එහි වම් කෙළවරේ අදාළ කොන්ත්‍රාත්තුවේ නම සඳහන් කර 2026.09.17 දින පෙ.ව. 11.00 ට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථා ප්‍රධාන කාර්යාලයේ දෙවන මහලේ ප්‍රසම්පාදන අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම සිදු කළ හැකිය.

විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රසම්පාදන ලේඛන 2026.09.17 දින පෙ.ව. 11.00 ට පසු වූ වහාම ප්‍රසම්පාදන අංශයේ දී ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී විවෘත කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ප්‍රසම්පාදන ලේඛන ප්‍රතික්ෂේප කරන අතර විවෘත කිරීමකින් තොරව ආපසු භාර දෙනු ලැබේ.

අදාළ ප්‍රසම්පාදන ලේඛන පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් වශයෙන් හෝ පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු 0112-525063 වෙතින් ලබා ගත හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව
අංක:15, රොක්හවුස් පටුමග,
කොළඹ 15.